# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

පෙරහැර අංකය :- ......................

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**<u>50 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2024</u> – (2024 ඔක්තෝබර් මස 28, 29 සහ 30)**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 50 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2024 ඔක්තෝබර් මස 28, 29 සහ 30 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.**

මෙම උපාධි ප්‍රදානෝත්සවය සැසි 09 කින් යුක්ත වන අතර ඔබට නියමිත සැසිය පහත දැක්වේ.

පළමුවන සැසිය - **2024 ඔක්තෝබර් මස 28 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා** මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය), ශාස්ත්‍රවේදී (විශේෂ), ශාස්ත්‍රවේදී ගෞරව, සංස්කෘත ශාස්ත්‍රවේදී ගෞරව, පාලි ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ ශිෂ්ටාචාරය ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ උරුමය හා සංචාරක ව්‍යාපාර ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ දර්ශනය ශාස්ත්‍රවේදී ගෞරව, දර්ශනය ශාස්ත්‍රවේදී ගෞරව, මනෝවිද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, දේශපාලන විද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, සිංහල ශාස්ත්‍රවේදී ගෞරව, ජනසන්නිවේදනය ශාස්ත්‍රවේදී ගෞරව, ව්‍යාපාර සංඛ්‍යානය ශාස්ත්‍රවේදී ගෞරව සහ සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

දෙවන සැසිය - **2024 ඔක්තෝබර් මස 28 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා** මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ මානව විද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, අපරාධවිද්‍යාව හා අපරාධ යුක්තිය ශාස්ත්‍රවේදී ගෞරව, ආර්ථික විද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී ගෞරව, ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම ශාස්ත්‍රවේදී ගෞරව, භූගෝල විද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, භූ අවකාශීය තාක්ෂණ විද්‍යාවේදී ගෞරව, පුරා විද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව, ඉතිහාසය ශාස්ත්‍රවේදී ගෞරව, නර්තනය හා සංස්කෘතික අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව, හින්දි ශාස්ත්‍රවේදී ගෞරව, සංගීතය ශාස්ත්‍රවේදී ගෞරව, සමාජවිද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව සහ තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

තෙවන සැසිය - **2024 ඔක්තෝබර් මස 28 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා**

- තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදි ගෞරව උපාධිය, ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා
- ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

සිව්වන සැසිය - **2024 ඔක්තෝබර් මස 29 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා** කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ වාණිජවේදී (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

පස්වන සැසිය - **2024 ඔක්තෝබර් මස 29 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා** කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය , විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හයවන සැසිය - 2024 ඔක්තෝබර් මස 29 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හත්වන සැසිය - 2024 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා

ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සහ විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධියට අයත් සියලුම උපාධිලාභීන් සහ

විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ {දෙවන පෙළ ඉහළ, දෙවන පෙළ පහළ }ශ්‍රේණි සඳහා අයත් සියලුම උපාධිලාභීන් සඳහා

අටවන සැසිය - 2024 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා

- ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ සාමාන්‍ය සාමර්ථ්‍යයට අයත් සියලුම උපාධිලාභීන් සඳහා
- වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍යවේදී සහ ශල්‍යවේදී, විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව, විද්‍යාවේදී හෙද ගෞරව සහ ඖෂධවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

නවවන සැසිය - 2024 ඔක්තෝබර් මස 30 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනසූරි, දර්ශනපති, දර්ශනපති ව්‍යාපාර ආර්ථික විද්‍යාව, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, කළමනාකරණ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, දත්ත විද්‍යාව හා කෘත්‍රිම බුද්ධිය විද්‍යාපති, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාපති,ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, රාජ්‍ය කළමනාකරණපති, රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණ විද්‍යාපති,ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යා පශ්චාද් උපාධිය, ව්‍යවසායකත්වපති, වෘත්තිය ගිණුම්කරණපති,ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, ව්‍යාපාර ආර්ථික විද්‍යා විද්‍යාපති, සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය, දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය පශ්චාද් උපාධිය, ව්‍යවසායකත්වය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දේපල කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය සහ දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රයට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

සැ.යු.:- ඔබ වෙත පිරිනමනු ලබන උපාධි සහතිකයට, උප්පැන්න සහතිකයට අනුව ඔබගේ නම සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් ඇතුලත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ලියාපදිංචි ලේඛනයන්හි හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමත අවසන් ප්‍රතිඵල ලේඛනයන්හි සඳහන් ආකාරයට බැවින් කිසිඳු ආකාරයක වෙනසක් සිදු නොකරන බව අවධාරණයෙන් යුතුව දන්වා සිටිමි.

1. <u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>

පහත සඳහන් දිනවලදී ඔබට අදාළ පීඨයේදී පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ පස්වරු 1.00 සිට පස්වරු 4.00 දක්වා උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම, සාටකය සහ ප්‍රවේශ පත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.

- <u>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය</u>

  2024 ඔක්තෝබර් මස 19 සහ ඔක්තෝබර් මස 20

- <u>තාක්ෂණ පීඨය</u>

  2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20 සහ ඔක්තෝබර් මස 21

➢ <u>ඉංජිනේරු පීඨය</u>

2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20 සහ ඔක්තෝබර් මස 21

➢ <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය</u>

2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20 සහ ඔක්තෝබර් මස 21

➢ <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20

➢ <u>වෛද්‍ය විද්‍යා පීඨය</u>

2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20 සහ ඔක්තෝබර් මස 21

➢ <u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය</u>

2024 ඔක්තෝබර් මස 19, ඔක්තෝබර් මස 20 සහ ඔක්තෝබර් මස 21

- උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත / මාර්ගගත ගෙවුම් ලදුපත), ශිෂ්‍ය වාර්තා පොත සහ මෙම ලිපිය පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. <u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේ දී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>.

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාළ ගිණුම් අංකය සහිත ආදර්ශ රිසිට් පත බාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර බාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය <u>2024 ඔක්තෝබර් මස 11 දිනට පෙර</u> සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee'**

තවද, විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පලකර ඇති පහත සඳහන් අයදුම්පත සම්පූර්ණ කර <u>උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී පීඨ කාර්යාලය වෙත අනිවාර්යෙන්ම බාර දිය යුතු වේ.</u>

1. උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)

තවද, විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ (https://www.sjp.ac.lk/students/) හි පලකර ඇති උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය (Graduate Employability Survey) සඳහා වන ගූගල් ආකෘති පත්‍රය ද (Google Form) අන්තර්ජාලය ඔස්සේ මාර්ගගතව උපාධි ලෝගු නිකුත් කරන දිනයට ප්‍රථම අනිවාර්යෙන්ම සම්පූර්ණ කල යුතුය.

එලෙසම උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු වන අතර, එම ආචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පල කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

තවද, කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුළ උපාධි ලෝගු හා හිස්වැසුම් නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව, හිස්වැස්ම නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබා ගත හැකිය.

## 2. උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ආපසු බාරදීම:

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ඔබගේ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය යුතුය. යම් හෙයකින් එලෙස භාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීඨ කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාර දිය හැකි අතර නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

- <u>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02**

- <u>තාක්ෂණ පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03 / නොවැම්බර් මස 04**

- <u>ඉංජිනේරු පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03 / නොවැම්බර් මස 04**

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03 / නොවැම්බර් මස 04**

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03**

- <u>වෛද්‍ය විද්‍යා පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03 / නොවැම්බර් මස 04**

- <u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය</u>

  **2024 නොවැම්බර් මස 02 / නොවැම්බර් මස 03 / නොවැම්බර් මස 04**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සහ හිස්වැස්ම සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

## 3. ඇඳුම්:

කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක <u>සාරි හෝ ඔසරිවලින්</u> අනිවාර්යයෙන්ම සැරසී සිටිය යුතු අතර පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

## 4. පැමිණීම:

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ වීමට <u>පැය එක හමාරකට පෙර</u> බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

5. **උපාධි පෙරහැරේ පෙළ ගැසීම:**

ගිහි පැවිදි සියලුම උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුතු අතර, ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳ සිටීම අනිවාර්ය වේ. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති පෙරහැර අංකයේ පිළිවෙලට පෙළ ගැසිය යුතුය. **උපාධි සාටකය පැළඳ ගැනීම සිදුකළ යුත්තේ උපාධිය පිරිනැමීම සඳහා ඔබ වේදිකාවට පිවිසෙන අවස්ථාවේදී පමණක් බව කරුණාවෙන් සලකන්න. ඉන් පසුව උපාධි ප්‍රදානෝත්සවය අවසන් වන තෙක් එය පැළඳ සිටිය යුතුය.**

6. **පෙරහැර අංකය පැළඳ සිටීම:**

ඔබගේ උපාධි සහතිකය වෙනත් උපාධිලාභියකු වෙත නිකුත් වීම වැළැක්වීම සඳහා ඔබගේ පෙරහැර අංකය උපාධි ලෝගුවේ අලවනු ලැබේ. ඔබ ප්‍රධාන වේදිකාවට ප්‍රවිශ්ඨ වන අවස්ථාවේ දී එම පෙරහැර අංකය උපාධි සාටකයෙන් නොවැසෙන පරිදි තබා ගත යුතු අතර, එය ඉතා ප්‍රවේශමෙන් උපාධි ලෝගුවෙන් නොගැලවෙන සේ තබා ගැනීමට ඔබ විසින් වගබලා ගත යුතුය.

7. **වේදිකාව තුළ දී උපාධි සහතිකය ලබා ගැනීම:**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව, උපාධිලාභීන්ගේ නම් ප්‍රකාශ වන අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය ප්‍රදානය කරනු ලැබේ.

8. **ප්‍රවේශ පත්‍ර:**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, වාහන ප්‍රවේශ පත්‍රය ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු 18 ට අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

9. **උපාධි පිරිනැමීම නිමාව:**

එක් සැසියක් අවසානයේ සංග්‍රහයක් පැවැත්වෙන අතර, ඊට අදාළ අවසර පත්‍ර ඔබගේ ප්‍රවේශ පත්‍රය සමඟ ඇත. ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභීන්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට කටයුතු කරනු ලබන බැවින්, ඒ සඳහා බාධාවක් නොවන පරිදි ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී ඔබගේ සහයෝගය දක්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

10. **ඡායාරූප ලබා ගැනීම**

ඡායාරූප ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල ඡායාරූප ආයතනයක් තෝරා ගනු ලැබේ. විශ්වවිද්‍යාල නිල ලාංඡනය සහිතව ඡායාරූප නිකුත් කළ හැකි වනුයේ එම ආයතනයට පමණි. විශ්වවිද්‍යාලය මගින් අනුමත ඡායාරූපවල ප්‍රමාණයන් හා මිල ගණන් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් පසුව දැනුවත් කරනු ලැබේ. ඡායාරූප ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත අත්තිකාරම් ගෙවීම උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී කළ හැකිය. ඡායාරූප ලබා ගැනීම සඳහා වැඩි විස්තර උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී අදාළ ආයතනයේ නියෝජිතයන්ගෙන් ලබාගත හැකිය.

11. උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලබා ගන්නා සියලුම උපාධිලාභීන්ගේ නාමලේඛන ඇතුලත් විශේෂ අතිරේකයක් **2024.10.27 (ඉරිදා)** දින **Sunday Observer** පුවත්පත සමඟ නිකුත් කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ලේඛකාධිකාරී වෙනුවට

**සැලකිය යුතුයි.**

- **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතූන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වැළකිය යුතුය.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

**Procession Number:-.........................**

Reverent Monk
Dear Sir/Madam/Miss

**50th Convocation 2024 – (28th, 29th and 30th October 2024)**

**The 50th Convocation of the University of Sri Jayewardenepura will be held on 28th, 29th and 30th October 2024 at the Bandaranaike Memorial International Conference Hall, Baudhaloka Mawatha, Colombo 07.**

This convocation consists of 09 sessions, and the session to which you belong is specified below.

**01st Session** - **28th October 2024, 8.00 a.m to 10.00 a.m. – Graduands Faculty of Humanities and Social Sciences { Bachelor of Arts, Bachelor of Arts (General), Bachelor of Arts (Special), Bachelor of Arts Honours, Bachelor of Arts Honours in Sanskrit, Bachelor of Arts Honours in Pali, Bachelor of Arts Honours in Buddhist Civilization, Bachelor of Arts Honours in Buddhist Heritage and Tourism, Bachelor of Arts Honours in Buddhist Philosophy, Bachelor of Arts Honours in Philosophy, Bachelor of Arts Honours in Psychology, Bachelor of Arts Honours in Political Science, Bachelor of Arts Honours in Sinhala, Bachelor of Arts Honours in Mass Commiunication, Bachelor of Arts Honours in Business Statistics and Bachelor of Arts Honours in Social Statistics.}**

**02nd Session** - **28th October 2024, 11.00 a.m to 01.00 p.m. - Graduands Faculty of Humanities and Social Sciences {Bachelor of Arts Honours in Anthropology, Bachelor of Arts Honours in Criminology and Criminal Justice, Bachelor of Arts Honours in Economics, Bachelor of Arts Honours in English, Bachelor of Arts Honours in Teaching English as a Second Language, Bachelor of Arts Honous in Geography, Bachelor of Science Honours in Geo – Spatial Technology, Bachelor of Arts Honours in Archaeology, Bachelor of Arts Honours in History, Bachelor of Arts Honours in Dance and Cultural Studies, Bachelor of Arts Honours in Hindi, Bachelor of Arts Honours in Music, Bachelor of Arts Honours in Sociology and Bachelor of Science Honours Degree in Information Technology.}**

**03rd Session** - **28th October 2024, 2.30 p.m to 04.30 p.m. – Graduands Faculty of Technology {Bachelor of Engineering Technology Honours, Bachelor of Biosystems Technology Honours and Bachelor of Information & Communication Technology Honours Degree.}**

- **Graduands Faculty of Engineering (Bachelor of the Science of Engineering Honours Degree.)**

**04th Session** - **29th October 2024, 8.00 a.m to 10.00 a.m. – Graduands Faculty of Management Studies and Commerce {Bachelor of Commerce (Special), Bachelor of Science in Accounting (Special) and Bachelor of Science in Marketing Management (Special) .}**

**05th Session** - **29th October 2024, 11.00 a.m to 01.00 p.m. – Graduands Faculty of Management Studies and Commerce {Bachelor of Science in Business Administration (Special), Bachelor of Science in Business Administration (Business Economics) (Special), Bachelor of Science in Entrepreneurship (Special) and Bachelor of Science in Management (Public) (Special) Degree.}**

**06th Session** - **29th October 2024, 02.30 p.m to 04.30 p.m. – Graduands Faculty of Management Studies and Commerce {Bachelor of Science in Finance (Special), Bachelor of Science in Human Resource Management (Special), Bachelor of Science in Operations and Technology Management (Special), Bachelor of Science in Business Information Systems (Special) and Bachelor of Science in Estate Management and Valuation (Special) Degree.}**

**07th Session** - **30th October 2024, 8.00 a.m to 10.00 a.m. - Graduands Faculty of Applied Sciences {Bachelor of Science (Honours), Bachelor of Science (Honours) in Applied Sciences and**
**Bachelor of Science General Degree (Second Class Upper, Second Class Lower).**

**08th Session** - **30th October 2024, 11.00 a.m to 01.00 p.m. – Graduands Faculty of Applied Sciences {Bachelor of Science General Degree (Ordinary Pass)}**

- **Graduands Faculty of Medical Sciences {Bachelor of Medicine and Bachelor of Surgery, Bachelor of Science Honours in Human Biology, Bachelor of Science Honours in Medical Laboratory Sciences, Bachelor of Science Honours in Nursing and Bachelor of Pharmacy Honours Degree.}**

**09th Session** - **30th October 2024, 02.30 P.m to 04.30 p.m. – Graduands Faculty of Graduate Studies {Doctor of Philosophy, Master of Philosophy, MPhill in Business Economics, MSc in Food Science and Technology, MSc in Management, MSc in Industrial Analytical Chemistry, MSc in Data Science and Artificial Intelligence, MA in Teaching English as a Second Language, MSc in Real Estate Management and Valuation, MSc in Computer Science, MSc in Polymer Science and Technology, MSc in GIS and Remote Sensing, MSc in Forestry and Environmental Management, MSc in Applied Finance, MSc in Applied Statistic, Master of Business Administration, Master of Public Management, Master of Science in Public Policy and Management, Master of Applied Statistics, Master of Entrepreneurship, Master of Professional Accounting, Master of Business Economics, Master of Science in Business Economics, Master of Sociology, Master of Data Science and Artificial Intelligence, Postgraduate Diploma in Management, Postgraduate Diploma in Industrial Analytical Chemistry, Postgraduate Diploma in Data Science and Artificial Intelligence, Postgraduate Diploma in Teaching English as a Second Language, Postgraduate Diploma in Entrepreneurship, Postgraduate Diploma in Real Estate Management and Valuation, Postgraduate Diploma in Polymer Science and Technology, Postgraduate Diploma in Applied Finance, Postgraduate Diploma in Applied Statistics and Postgraduate Certificate in Data Science and Artificial Intelligence.**

**N.B:- It is informed with emphasizing that your name on your degree certificate will be entered in both Sinhala and English , as per your birth certificate information specified in the university registration documents and the final result documents approved by the University Council and no changes will be made.**

1. **Issuance of Cloaks and Passes:**

**You will be issued the hat, shawl and passes along with the cloak at your respective Faculty from 9.00 am to 12.00 noon and 1.00 pm to 4.00 pm on the following dates.**

- **Graduands Faculty of Humanities and Social Sciences**
  **19th October 2024 / 20th October 2024**

- **Graduands Faculty of Technology**
  **19th October 2024 / 20th October 2024/ 21st October 2024**

- **Graduands Faculty of Engineering**
  **19th October 2024 / 20th October 2024/ 21st October 2024**

- **Graduands Faculty of Management Studies and Commerce**
  **19th October 2024 / 20th October 2024/ 21st October 2024**

- **Graduands Faculty of Applied Sciences**
  **19th October 2024 / 20th October 2024**

- **Graduands Faculty of Medical Sciences**
  **19th October 2024 / 20th October 2024/ 21st October 2024**

- **Graduands Faculty of Graduate Studies**
  **19th October 2024 / 20th October 2024/ 21st October 2024**

- **You are required to submit the relevant payment receipt of Rs.5,000 (Bank Receipt/Online Payment Receipt), your Student Record Book and this letter to the Faculty Office to obtain the Cloak, shawl and Hat and passes related to the convocation. If you have not yet submitted your student ID, it should be submitted to the Faculty Office on this occasion.**

To make the related payments, you may visit the student payment system on the university's website, where you can download the model receipt containing the relevant account number, and make the payment in cash to any Peoples' Bank branch. In addition to this, you also have the option to make your payment online using credit card. Please ensure that the cash payment receipt so paid and downloaded be prepared **before 11th October 2024**. You are kindly requested to make the payment before the above date to avoid any inconvenience in getting your cloaks.

You can access the necessary information on payments by following these steps on the university website.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee '**

**Further, you must complete and submit the following application, which are available on the university website, to the faculty office at the time of collecting the cloaks.**

1. **Cloak Fee Refund Application (Annexure i)**

**Further, Google Form on Graduands Employability Survey on the university web site (https://www.sjp.ac.lk/students/) should be completed before the date of issuing cloaks.**

Similarly, graduates are required to adhere to the code of conduct governing the use of the cloak, hat and shawl, which will be published on the university website. It is essential to thoroughly read, understand and comply with this.

Furthermore, under no circumstance will cloaks and hats be issued on the day of the convocation. It is imperative to note that without the cloak and hat, no lay graduate will be permitted to join the graduation procession. Ceremonial fans (*Vijinipats)* for graduating monks will be available at the Bandaranaike Memorial International Conference Hall on the day.

2. **Returning the hat, shawl and cloak**

After graduation ceremony concludes, please make sure to return the cloak along with the hat and shawl to the special counter set up at the Bandaranaike Memorial International Conference Hall. In case it is not possible to return them immediately, you may visit the respective faculty office on the following dates to return the hat, shawl and cloak. Please note that failing to return the hat and shawl, along with the cloak, by the designated date will result in a fine, the amount of which will depend on the delay's duration.

- **Graduands Faculty of Humanities and Social Sciences**
  **02nd November 2024**
- **Graduands Faculty of Technology**
  **02nd November 2024 / 03rd November 2024 / 04th November 2024**
- **Graduands Faculty of Engineering**
  **02nd November 2024 / 03rd November 2024 / 04th November 2024**
- **Graduands Faculty of Management Studies and Commerce**
  **02nd November 2024 / 03rd November 2024 / 04th November 2024**
- **Graduands Faculty of Applied Sciences**
  **02nd November 2024 / 03rd November 2024**
- **Graduands Faculty of Medical Sciences**
  **02nd November 2024 / 03rd November 2024 / 04th November 2024**
- **Graduands Faculty of Graduate Studies**
  **02nd November 2024 / 03rd November 2024 / 04th November 2024**

Upon returning the hat and shawl along with the cloak, you will be refunded the payment of Rs.5000, either in cash or credited to your account number. In addition, you will be responsible for covering the entire value of the cloak, hat and shawl provided to you if any of these items are found to be damaged or missing.

3. **Dress Code:**

Female graduates are required to wear Sarees or Osary (ඔසරි) in any colour of their preference, while male graduates must wear either the national dress or European attire, along with a tie.

4. **Attendance:**

The graduates should arrive at the Bandaranaike Memorial International Conference Hall one and a half hours prior to the beginning of the graduation ceremony and prepare for the procession.

5. **Graduation Parade Lineup:**

All lay graduates and monk graduates are required to participate in the procession, with lay graduates wearing both cloak and hat. Graduates must march in the specified sequence provided in the list of graduates, so you must line up in the order of the procession number assigned to you. Please note that the shawl is to be worn solely when you approaching the stage for the degree presentation and subsequently, it should be kept on until the conclusion of the graduation ceremony.

6. **Wearing the procession number:**

Your procession number will be affixed to the cloak to avoid your degree certificate from being issued to another graduate. When you approach the main stage, it is important to ensure that the procession number is visible and not covered by the shawl, and you must make sure to keep it securely attached to the cloak.

7. **Receiving the Degree Certificate on Stage:**

Following the commencement of the graduation ceremony, graduates will be invited to the stage in the sequence corresponding to the announcement of their names and conferred the degree by either the Chancellor of the University of Sri Jayewardenepura or the Vice-Chancellor.

8. **Passes:**

Each graduate must present the issued pass to gain entry to the Bandaranaike Memorial International Conference Hall. You will receive one pass for yourself and two additional passes for your parents or other guests. These passes will be provided to you along with cloak, shawl and hat, and vehicle passes will also be issued along with it. No one under the age of 18 will be permitted to enter the hall with these passes.

9. **Completion of Graduation:**

At the end of each session, refreshment will be hosted, and relevant passes for it will be included with your pass. Immediately following conclusion of the scheduled session, preparation will be made to arrange the procession for the graduates and the teaching staff for the subsequent session, so you are kindly requested to leave the main premises and the area where the procession is being organized, demonstrating your support and ensuring you do not disturb the proceedings.

10. **Capturing Photographs:**

An official photographer will be selected by the University to take photographs. Only this institution will have the authority to issue photographs featuring the university's official logo. The University will release the details about approved photograph sizes and pricing at later time on the University website. If you wish to make an advance payment for photographs, you may do so when obtaining your cloak. Further details on obtaining photographs can be obtained from the representatives of the respective photographer at the time of your cloak collection.

11. A special supplement containing names of all the graduates schedule to receive their degrees at the Convocation will be issued with the **Sunday Observer** newspaper on **27th October 2024 (Sunday).**

Senior Assistant Registrar / Academic Student Affairs, Publications & Examinations Division
University of Sri Jayewardenepura
Gangodawila, Nugegoda,
Sri Lanka.

Senior Assistant Registrar
Academic Student Affairs, Publications and Examinations Division
For Registrar

Important:

- Please note that, for security reasons, it is essential for both you and your accompanying guests to refrain from bringing cameras and mobile phones etc. into the Bandaranaike Memorial International Conference Hall as they are not permitted.